


වර්ෂ 1999 ජනවාරි 27 දා ඒ දවස්වල නාවල තිබුණ නිෂූ ශබ්දාගාරයේදී "සිංග්ලංකා" සමාගම වෙනුවෙන් අළුත් ම ගීත පහකට හඬ කවනු ලැබුවා. හඬ කැවීම කළේ විශාරද දීපිකා ප්‍රියදර්ශනියයි. රෝහණ වීරසිංහ සංගීතවේදියාගේ සංගීත මෙහෙයුමට මේ විදියට දීපිකා ගීතවත් වුණේ ප්‍රවීණ ගීත රචකයින් දෙපලක් වුණ මහාචාර්ය සුනිල් ආරියරත්නයන්ගේත්, සුනිල් ආර් ගමගෙ " නිබන්ධකයාණන්ගේත් ගී පද රචනා දෙකක් සහ උපුල් ශාන්ත සන්නස්ගල, ආනන්ද හේවාරංහිඳ-ගේ සහ අපගේ ගී පද රචනා තුනක් වෙනුවෙන්. මේ නවකයින් තුන්දෙනා අතර සිටි ආනන්ද හේවාරංහිඳගේ සොයුරා පසු ගිය දා අප අතරින් සදහටම සමුගත්තා.

දීපිකාගේ මේ ගී එකතුව තවත් නවක රචක රචිකාවියන් හතර දෙනෙකුගේ ගීතත් සමඟින් වර්ෂ 2000 මාර්තු මාසයේ "මල් වරුසා" නමින් දොරට වැඩියා. "මේ වහින්නේ" ගීතය ලියමින් සීතා රංජිනී මාධ්‍යවේදිනිය "හීන් ඇළිරියේ" ගීතය ලියමින් රියෙන්සි නිහාල් "ඔබ හීනයක් වගේ" ගීය ලියමින් රවී සිරිවර්ධන සහ "අහස නුඹ මෙතරම්" ගීය ලියමින් ආනන්ද හේවාරංහිඳගේ එදා කොළඹ මහජන පුස්ථ කාල ශ්‍රවනාගාරයට එකතු වුනා. "මැද්දේගම් ගිය මද්දුමයෝ" ගියත් "හාද වෙන්ට ආවා තමයි" ගීයත් ලියමින් හවුල් වුණ මට ඔවුන්ව හඳුනාගන්න ලැබුණෙ එදයි. අනන්දගේ මුල් හමුවීමම හොඳ


ආනන්ද, හේවාරංහිඳ

ගෙන්වා ගත්තේ ආයාසයෙන්. ශ්‍රී ලංකා ගීත රචක සංසදයෙත් ඔහු සමාජිකයෙක් වුණා. අපේ ගී පද රචනා නොකර තිබුණත් දොරට වැඩීමේ උත්සව වලට උදව් කරන්න ගිහින් එකට වැඩ කරපු හැටි මතක් වෙනවා. තැටි විකුණන රාජකාරිය වැඩිපුර පැවරුණේ අපට. ඒ විශ්වාසවන්ත කමට වෙන් ඇති. ආනන්ද ගේ තවත් එක මතකයකින් "ගී සඳළුව" ඉවර කරන්නම්.

# සොයුර ආනන්ද, හේවාරංහිද !

සිහිවටනයක් වුණා.

සමකාලීන ගීත රචනා පරපුරක වඩාත් රසිකයන්ට ළංවෙන්නට පුළුවන් ගීත නිබන්ධය කරමින් ආනන්ද ආ මඟ සුන්දර වෙන්නේ ඒක රසිකයින්ගේ හදවත් සමඟ බැඳී ආ ගමනක් නිසා. ගීයක වටපිටාව ගැන විමසිලිමත් වෙන "ගී සඳළුවේ" ඉඩ කඩ ආනන්ද ගැන මතක සටහන් කීපයකින් පුරවන්නට අවසර !

ආනන්දගේ ගීත අතරින් ඊළඟට ජනප්‍රිය වුණ ගීතය හැටියට මතක් වෙන්නේ රෝහණ වීරසිංහයන් ම සංගීතවත් කරලා ජානක වික්‍රමසිංහ ගායන ශිල්පියා ගායනා කරපු "දෙවොරේ දිළෙනා" ගීතයයි. අමුතුම කෝණයකින් ආදරය ප්‍රකාශ කරපු මේ පදවැල අමතන්නේ "හඳයා" නම් තමන්ගේ තිරික්කලය බැන්ද ගවයාට. මේ ගීතයේ ගැමි සුවඳ තවරන්නට ආනන්ද උපයෝගී කරගත්තේ ගැමි බස් වහර. ඔහුගේ වඩාත්ම ජනප්‍රිය ගීතය වුණේ විශාරද එඩ්වඩ් ජයකොඩි ගායන ශිල්පියා, නතාෂා පෙරේරා ළමා ගායන ශිල්පිනිය සමඟින් ගැයූ "සුළඟක් වී මං යනවා" ගීතයයි. ඒ ගීතයේ සංගීත නිර්මාණය විශාරධ රෝහණ ධර්මකීර්ති සංගීතවේදීයාගේ. අප රටින් බැහැර වුණාට පස්සේ සශිකා නිසංසලා ගායන ශිල්පිනිය වෙනුවෙන් "මහත්තයෝ" ගීතයත් ජනප්‍රිය වුණ බව ආරංචියි. මේ ඔහුගේ ජනප්‍රිය ගීත කිහිපයක් විතරයි.

ජ්‍යේෂ්ඨ ගීත රචකයෙකුගේ මව්ගේ අවමංගල ලෙය්ත්වයකදී අප මුණගැහුණා මතකයි. අවමංගල්‍ය පෙරහැරේදී පවා අපේ කතාව වුණේ ගීත ගැනයි. ඒ ඔහු "සුළඟක් වී" ගීතය ලියූ කාලයයි. "මල් වරුසා" ගී එකතුවට කලින් නිකුත් වුණ වික්ටර් රත්නායක සංගීතවේදීයාගේ "ගිගිර ගීත රාවය" ගී එකතුවට මා ලියූ "නිය පෙළ සිඳලයි" ගී පද රචනාව අගය කළ හැටි මට අද වගේ මතකයි. එකම තේමාවක් වුණත් ඒ ගීත දෙකේ වෙනස ගැන ඔහු කතා කළේ ඒවායින් ලැබුණ ආ ලාදය උපරිමයෙන් විදීමින්.

ගී ක්ෂේත්‍රයට සම්බන්ධ බොහෝ උත්සව වල ආනන්දව දකින්නට ලැබුණා. ඒත් ඒ වේදිකාව උඩ හරි පෙර පෙළ ආසනයක නෙවෙයි; කොරිඩෝවක, ආලින්දයක නැත්නම් පසුපෙළ හිටගෙන. ඕනෑකමකට වුණත් ඔහුව ඉස්සරහට

ජානක වික්‍රමසිංහගේ "ආදරෙන් බලන්න" ගීත එකතුව දොරට වැඩියෙ පොළොන්නරුවෙ ජානක ඉගෙන ගත්ත ඉස්කෝලෙදි. එහේ යන්න සුබෝපබෝගී බස්රථ, නවාතැන් පිළියෙල කරලා තිබුණා. ප්‍රවීනයන් වාගේම නවකයන් එක්ක එකට ගිය ඒ ගමන හරි විනෝද වුණා. මට නවාතැන් සළස්වලා තිබුණේ බණ්ඩාර ඇහැළියගොඩ ප්‍රවීනයත් එක්ක. උත්සව ශාලාවට වාහනයකින් යන දුර. උත්සවයෙන් පස්සේ අපේ කට්ටිය මදුවිතින් හොඳට පදම් වුණා. අනන්ද හිටියෙ අපිත් එක්ක. කොහොමත් සංවේදී හිතක් තියෙන ආනන්ද ට මධුවිත ටිකක් තොලගෑවුණාම තවත් සංවේදී වෙනවා. කොයි තරමට සංවේදී වුණාද කිව්වොත් අපේ නවතැන් පළවල්වලට යන වාහන අපව දාලා ගිහින්. අන්තිම ආනන්දත් එක්ක වඩුගේ සහෘදයා-ගේ කාමරයට කඩාවදින්නයි අපට වුණේ. ඒ රාත්‍රිය අපට හරිම දිග රාත්‍රියක් වුණා.

මව් බිමේ සිටියානම් මාර්තු දහ නවවැනිදා සවස ඔබට අවසන් ගෞරව කරන්නට අනිවාර්යෙන්ම එන්න තිබුණා. ඒ වාගේ දේවල් මඟ ඇරෙන කොට ඔබගේ වියෝව ගැන තියෙන දුක තවත් වැඩිවෙනවා. ඉතින් සොයුරාණනි, ඔබට නිවන් සුව !

සිසිර දිසානායක

අහස නුඹ මෙතරම් සැඩයැයි
දැනුනෙ මහ වැසි වැටුණාමයි
පොළව නුඹ මෙතරම රළුයැයි
හැඟුනෙ නියඟය ආවාමයි

රෑට තරු ඉසිනා අහසට
අඳුර සිත් ලැබුණේ කොහොම ද ?
නේක මල් සදනා පොළවට
නපුරු සිත් කොයිබින් ලැබුණිද ?

නීල ඉඳුවර පෑ අහසට
කඳුළු වැසි දුන්නේ කවුරු ද ?
පලා පෑ ඉසිලූ මිහිමත
නියං ඇතිරෑයේ කවුරු ද ?

# මම ළඟදීම හින්දි ගී සංගත තැටියක් නිකුත් කරන්න බලාපොරොත්තු වෙනවා

## ලලිත් අරුණශාන්ත රහසක් හෙළි කරයි

ලලිත් අරුණශාන්ත මට හමුවුණේ 2005 හා පුරා කියා ඔස්ට්‍රෙලියාවට පැමිණි මොහොතේ ඔහුගේ "ගී අරුණ" ඒක පුද්ගල ගීත ප්‍රසංගයට සූදානම් ව සිටි මොහොතේදී යි. මගේ මිත්‍ර ජගත් ජේ එදිරිසිංහ සොයුරා මාව ලලිත් අරුණ ශාන්තට හඳුන්වා දුන්නා. හා පුරා කියා මෙල්බන් වේදිකාවේ නිවේදක කටයුත්තක් ආරම්භ කළේ ලලිත්ගේ මේ ප්‍රසංගයේ දී යි. අවුරුදු පහකට පසුව ඒ අතීත සිදුවීමත් මතකයේ නගා ගනිමින් මෙබන් ගී ප්‍රසංග වලදී ඉතා අපූරුවට ගීත ගායනා කරමින් සැමගේ සිත් දිනාගත් ලලිත් සමග කතා බහකට එක්වන්නට පසුගියදා මටත අවස්ථාව ලැබුණා.

***ඔබ ළඟදී ප්‍රසංගයක් කරන්න බලාපොරොත්තුවක් නැද්ද?***

පුංචි බලාපොරොත්තුවක් තියෙනවා. ළබන වසර වන විට අලුත් සංගත තැටියකුත් අලුත් ආරක ප්‍රසංගයකුත් කිරීමට මම බලාපොරොත්තු වෙනවා. මේ පිළිබඳව මාව උනන්දු කරවන්නෙ මගේ හිතමිත්‍රාදීනුයි.

***ඔබ සංගීතයට යොමු වුණේ කොහොමද?***

පුංචි කාලයේ සිටම මම සංගීතයට දැඩි ඇල්මක් දක්වූවා. ඒ කාලයේ සිටම මට ගී ගායනා කිරීමේ හැකියාවක් තිබුණා. ඒ වගේම විවිධ කලා ශිල්පීන් මට නිතර මුණ ගැසුණා.

***අපි දන්නවා ඔබේ පියා කොළඹ යුගයේ දක්ෂ කවියකු වූ හේමචන්ද්‍ර ගුණතිලක මහතායි.***

ඔව්. පියා නිසා තමයි මට මේ හැකියාවන් ලැබුණෙ. පියා හමුවීමට පැමිණෙන බොහෝ කලාශිල්පීන් මට අඳුනාගන්න ලැබුණා. පියා සමග යම් යම් උත්සව වලට යනවිට ඒ අවස්ථාවලදීත් මගේ සිත කලාවට ඇදී ගියා. මට දැන් මතක් වෙනවා මම පුංචි කාලයේදී සී ටී ප්‍රනාන්දු මහතාගේ ගීත ගායනා කළ හැටි. ඒ නිසාම සී ටී ප්‍රනාන්දු මහතාගේ ගී ප්‍රසංගයක් බලන්න කොළඹ ආනන්ද විද්‍යාලයට මාගේ පියා මාව රැගෙන ගියා. එහිදී ඇසූ ගීත අදටත් මගේ මතකයේ තියෙනවා.

***ඔබේ පාසල් දිවිය ගැන සිහිපත් කළොත්***

මම අධ්‍යාපනය ලැබුවේ මරදානේ මහාබෝධි මහා විද්‍යාලයේ හා නුගේගොඩ ශාන්ත ජෝන් විද්‍යාලයේ යි. මට වැඩියෙන් සංගීතය ඉගැන්නුවේ මහබෝධි විධ්‍යාලයේ සිටි සංගීත ගුරුවරිය වූ විශාකා විජේසිංහ මහත්මියයි. මම පාසලේ තූර්ය වාදක කණ්ඩායමේත් හිටියා. ඒ කාලයේ ත් දූන් වගේ තැන තැන පැදුරු සාජ්ජ පැවැත්වුණා. ඒවායේ ගී ගයන්න මාව කැඳවාගෙන ගියා. එහිදී විවිධ ගීත ගායනා කළා.

***ඔබ ඔස්ට්‍රේලියාවට සංක්‍රමණය වුණේ මොන කාලෙද?***

1987 දී. එතැන් සිට මම ආර්ජ්සීවී ආයතනයේ රැකියාව කරනවා. දැන් මම එහි අවුරුදු 20ක් සේවය කර තිබෙනවා. ශ්‍රී ලංකාවේදී ජර්මන් කාර්මික අභ්‍යාස විද්‍යාලයෙන් මා ලද කාර්මික දැනුම මේ සඳහා මට ඉවහල් වුණා. කාර්මික අධ්‍යාපනයෙන් පසුව කලක් මම එහි ගුරුවරයකු ලෙසද සේවය කළා. කාර්මික විද්‍යාලයේ ඉගෙන ගන්න කාලෙදිත් මම ගීත ගායනා කළා. මේ කාලය වන විට මගේ සිත බයිලා වලට ඇදී ගොස් තිබුණා. සැම ආකාරයකම ගීත ගායනා කිරීමේ හැකියාවක් මට තිබුණා.

***ඔබ් පළමුවන සංගත තැටිය කුමක්ද?***

ඒ තමයි "තනි තරුව". ඉන්පසුව මම තවත් අත්දැකීම් අරගෙන "ඉස්පිලි පාපිලි" සහ "විසිරිලා සිත" කියන සංගත තැටි දෙක කළා. මේ දෙවන හා තෙවන සංගත තැටි වල සමහර ගී තනු මමම නිර්මාණය කළා.

***මේ දිනවල ඔබ නිරතව ඉන්නෙ මොන වගේ කටයුතු වල ද?***

මේ දවස් වල මම හින්දි ගී ගායනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කර තිබෙනවා. ඒකට හේතුව වුණේ මම ප්‍රසංගයකදි ගීත ගායනා කරනවා දැකලා ඉන්දියානු ජාතිකයන් විශාල පිරිසක් මා සමග හිතවත් වීම. ඔවුන් ගේ බොහෝ ප්‍රසංග වලට ගී ගායනය සඳහා මට ආරාධනා කරනවා. අපේ ශ්‍රී ලාංකික වේදිකාවට අප අමතක වනවිට ඉන්දියානු වේදිකා වලට අපට ආරාධනා ලැබීම එක අතකින් සතුටක්. ඉන්දියානුවන් සංවිධානය කරන වික්ටෝරියාවේ ලැව් ගිනි වලින් අනාථ වූවන්ට සහන සළසන සංගීත ප්‍රසංගයේ පවා ගී ගයන්න ඔවුන් මට ආරාධනා කර තිබෙනවා.

***ඔබ ගායනයට තෝරා ගන්නේ මොන වගේ ගීතද?***

මොහොමඩ් රාෆි මහේන්ද්‍ර සිං ගායකයන්ගේ ගීත සදා අනුස්මරණීයයි. ඒ ගලීත අහන්න හුඟක් අය කැමතියි. ඒ නිසා මම ඒ ගීත වැඩි වශයෙන් තෝරා ගන්නවා.

***ඔබේ ඉදිරි වැඩ කටයුතු කොහොමද?***

ඉතා දක්ෂ ඉන්දියානු ගීත රචකයෙක් මේ දිනවල මට ගීත කීපයක් ලියමින් සිටිනවා. ඒ ගීතත් සමග හින්දි ගී සංගත තැටියක් කරන්න මම බලාපොරොත්තු වෙනවා.

***ඔබේ වැඩකටයුතු වලට සහය වන අය කවුද?***

මගේ බිරිඳ අයේෂා නිලන්ති ගුණතිලක



සෙවණැල්ලක් වගේ මගේ පසුපසින් සිටිනවා. පුතා ලක්බිත . දුව උපුලී. ඒ අය සංගීත ක්ෂෙත්‍රයට ඉතාම ලැදියි. එය මා ලැබූ ජයග්‍රහණයක්. මා ගැයූ "නුවර වාහල් දොරටු පසුකර" ගීතයේ සංගීත නිර්මාණය කළේත් මගේ පුතායි.

***ඔබේ ලිපිනය***

40 Mont Court
Vermont South Vic 3133
Australia

ප්‍රසංග වේදිකාව ඔහුට හුරු පුරුදුය. නිදහස් ලෙස වේදිකාවේ ඇවිද යමින් ඔහු කරන ගායනය බලා සිටීමද සතුටකි. මෙවන් දක්ෂ ගායකයන් අපේ සමාජයට සම්පතක් නොවේද? ඔවුනගේ හැකියාවන්ගෙන් නිසි ප්‍රයෝජන ගැනීම අදාල අයගේ යුතුකමක් වන බව නැවත සිහිපත් කරන්නට මම කැමැත්තෙමි.

ශ්‍රීනාත් මද්දුමගේ